

# 18 පොතපතෙන් සරු දහම්

කිසියම් චර්යාවක්, හැසිරීමක් යහපත් යැයි සමාජයේ පිළිගැනීමක් ඇති වූ විට එය සාරධර්මයක් ලෙස සැලකිය හැකි ය. සමාජයේ සාමූහික එකඟතාව සාරධර්මයක පදනම යි.

සාහිත්‍ය නිර්මාණයක අපේක්ෂාව වන්නේ ජීවිතය පිළිබඳ අවබෝධය පුළුල් කිරීම යි. සාහිත්‍යය මවක මෙන් උපදෙස් දෙයි. සාහිත්‍යයේ එන ජීවිත විවරණ, ඍජු උපදේශ ස්වරූපයක් නොව යහපත පිළිබඳ අදහස් වශයෙන් මනා අවබෝධයකින් යුක්තව මනසේ තහවුරු වේ. ජීවිතය හැඩගස්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය උපදේශ ලබා දෙන්නට ම ලියැවුණු පොතපත ද සාහිත්‍යයෙහි බහුල ය. සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් ලබන අවබෝධය ඔස්සේ වඩා යහපත් ජීවිතයක් ගොඩනගා ගත හැකි ය. මේ පාඩම සාහිත්‍යයේ නිරූපිත සාරධර්ම කිහිපයක් ගැන අවධානය යොමු කරන්නකි.

යම් සමාජයක ජීවත් වන මිනිසුන්ගේ ජීවිත යහපත් ලෙස හැඩගස්වන, එම සමාජයේ ම වුවමනා තුළින් ම ඇති වුණු පිළිගැනීම්, විශ්වාස සහ සිරිත් විරිත් 'සාරධර්ම' ලෙස හැඳින්විය හැකි ය. සමාජයක ප්‍රගමනයට හේතු වන්නේ එහි වෙසෙන්නන් තුළ පවතින යහපත් ගුණාංග යි. සමාජයක ජීවත් වන අපට ඒ සමාජයේ පැවැත්මට හේතු වන චර්යා අනුගමනය කරන්නට සිදු වෙයි. මේ චර්යා හා සිරිත් විරිත් මිනිසා විසින් ම ඇති කර ගන්නා ලද හා පුරුදු පුහුණු කර ගන්නා ලද ගති පැවතුම් ය. මේවා ඈත අතීතයේ පටන් සකස් වෙමින් පැවත එන්නේ ය. බොහෝ සිරිත් විරිත් හා තහංචි පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රදායක් වශයෙන් මිනිසුන් උරුම කර ගත් හැසිරීම් ය. ඕනෑ ම සමාජයක ඒ ඒ අයගේ ජාතියට, ආගමට, විශේෂිත වූ චර්යා සිරිත් විරිත් දැකිය හැකි ය.

බුදුන් වහන්සේ දේශනා කළේ කෙනකුගේ උතුම් බව රැකෙන්නේ උත්පත්තියෙන් නො ව, ක්‍රියාවෙන් බව යි. මේ අදහස ම සනාථ කරමින් තිරුවල්ලුවර් නමැති ශ්‍රේෂ්ඨ හින්දු චින්තකයා **තිරුක්කුරල්** නමැති මානව ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථය රචනා කළේ ය. **පෙරියපුරාණම්** නමැති ග්‍රන්ථයේ ඇතුළත් චරිත කතා මගින් ද කෙරෙන්නේ සමාජයේ යහපත් බව රැක ගන්නට උපදෙස් දීම යි. **ශුද්ධ වූ කුරානයේ** සඳහන්ව ඇත්තේ ද ඉස්ලාම් ධර්මය මගින් සමාජයට යහපත සලසන ආකාරය යි. සියලු මනුෂ්‍යයන් දේව දරුවන් වන හෙයින් 'ඔවුහු සියල්ලෝ ම සහෝදරයෝ ය' යන අදහස ක්‍රිස්තු ධර්මයෙහි ඉගැන්වේ. කිතු දහමෙහි ද සමාජය යහපත් ලෙස පවත්වා ගෙන යෑමට අවශ්‍ය උපදෙස් අන්තර්ගත වී ඇති බව **බයිබලය** කියැවීමෙන් අවබෝධ කර ගත හැකි ය. මෙබඳු සෑම ග්‍රන්ථයක ම පාහේ ගැබ් වී ඇත්තේ යහපත් පුද්ගලයකු නිර්මාණය කරන සාරධර්ම බව පැහැදිලි ය.

පවුල අප සමාජයේ කුඩා ම ඒකකය යි. පවුලේ සාමාජිකයන් හැසිරිය යුතු ආකාරය අපි ගෙදර දී ම උගනිමු. ඉන් පසු සමාජයට පිවිසෙන අපට ඒ ඒ ආයතන යහපත් ගුණධර්ම උගන්වයි. සමාජයේ යහපත් පැවැත්මටත් පුද්ගලයාගේ චරිත සංවර්ධනයටත් පුද්ගලයා හා සමාජය අතර නිරවුල් අවබෝධය තහවුරු කරලීමත් මේ සාරධර්ම මහෝපකාරි වන්නේ ය. මේවාට පටහැනි වීම පුද්ගලයාගේ යථා පැවැත්මට හානි පමුණුවයි.

සිංහල සාහිත්‍යයේ උපදේශ ග්‍රන්ථ යනුවෙන් විශේෂයෙන් හැඳින්වෙන ශ්‍රේෂ්ඨ කෘති කීපයකි. **ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සුභාෂිතය, සිරිත්මල්දම** එබඳු පොත් ය. **ජාතක පොත් වහන්සේ** අපට උගන්වන යහපත් ගුණධර්ම මෙතෙකැ'යි ප්‍රමාණ කළ නොහැකි ය. බෞද්ධ සාහිත්‍යයේ සෑම ග්‍රන්ථයක ම අපට උගන්වන්නේ සාරධර්ම යි.

**සද්ධර්මරත්නාවලියෙහි** සඳහන් පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේගේ කථාවෙහි දී, ඇල්ලීමට නොව බැලීමට පවා නොහැකි ලෙස ශරීරය කුණු වී, ඇල්ලීමට නොව බැලීමට පවා නොහැකි ලෙස සැරව ගලමින් තිබූ අවස්ථාවේ ඒ තෙරුන්ගේ තුවාල සෝදා පිරිසිදු කරන්නේ ද බුදුන් වහන්සේ ම ය.

"ඒ ඇතාණෝ ද බුදුන් දැක ළඟට ගොසින් වැඳලා කැටි ව ආ අනික් තෙනක් නැති නියාව දැක වැඩ සිටි රුප්පයේ ම තණ පයින් උදුරා පියා අත්තක් කඩා ගෙන අවුත් හැමඳ පියා බුදුන් වස් වැස වැඩහුන් කල්හි වස් තුන්මස ම කළය සොඬින් හැරගෙන ගොසින් බොන පැනුත් ගෙනවුත් තබාලති."

- **සද්ධර්මරත්නාවලිය**

පාරිලෙය්‍ය ඇතා බුදුන් වහන්සේට උවටැන් කළ අයුරු මෙහි කියැවේ. එකිනෙකාට උදවු උපකාර හා උවටැන් කිරීම මගින් පුද්ගලයා යහපත් අයකු කෙරෙන බව බොහෝ සාහිත්‍ය ග්‍රන්ථ මගින් පැහැදිලි කෙරෙයි. චුල්ලහංස ජාතකයේ හංස සේනාධිපතියා හංස රාජයාණන්ට උපකාර කරන්නේ තම ජීවිතය ද පරදුවට තබමිනි.

"නුඹ වහන්සේ මරණ පාසයෙන් බැඳුණු සේක. මම ස්නේහ පාසයෙන් බැඳී ගියෙමි. එහෙයින් මියෙතත් එක්ව ම ය. ගැලවී යතත් නුඹ වහන්සේ හා එක්ව යෙමි'යි. ඉදින් ඇර පියා ගොස් මාගේ ජීවත් වීමට වඩා නුඹ වහන්සේ හා එක්ව රඳා මිය යාම උතුම් වන්නේ ය."

නූතන සාහිත්‍ය නිර්මාණ මගින් ද මේ සාරධර්මය ජීවිතවලට සම්බන්ධ කරනු දැක ගත හැකි ය.

විජේසිංහ අමතක ද උඹට
කම්හලේ රෝදයට
අත බිඳී ගිය දවස
නාදන් නොවෙ ද නුඹ
බේර ගත්තේ එදින
පිච්චමල් හදවතින්
ලේ දෙමින්
වාට්ටුව ළඟ ඉඳන්
මලමූත්‍ර ගෙන යමින්

- **ටියුඩර් අමරසේන**

මේ නිර්මාණයෙන් කියවෙන උපස්ථානය ජාති, ආගම් භේදයකින් තොරව කෙරෙන්නකි. නූතන කවියා සමගිය, සාමය ඇති කරන්නට කවිය යොදා ගත් අපූරු අවස්ථාවකි මේ. උවටැන් කිරීමේ දී සිත්හි මතු කර ගත යුතු උතුම් දහම මෙය යි. 'පිච්චමල් හදවතින්

ලේ දෙමින්' නාදන් විජේසිංහ බේරා ගනියි. මෙයින් සමාජයට දෙන පණිවිඩය ශ්‍රේෂ්ඨ ය. මේ සාරධර්මය ඉස්මතු කෙරෙන නිර්මාණ නූතන සාහිත්‍යයෙහි ද බොහෝ සෙයින් අපට හමුවෙයි. එසේ ම මෙබඳු උවටැන් තම දෙමවුපියන්ට කළ යුතු බව සාහිත්‍යයේ බොහෝ නිර්මාණවල දැකිය හැකි ය.

'මාතා පිතු උපට්ඨානං' යනුවෙන් මහා මංගල සූත්‍රයේ සඳහන් වෙයි. ඇතකු ලෙස ඉපදී තම අඳ මවුපියන් රැකි පුතකු ගැන මාතුපෝසක ජාතක කතාවේ සඳහන් වෙයි. මෙලෙස අප සාහිත්‍යයේ මේ උතුම් ගුණදහම ගැන වර්ණනා වී ඇත.

අම්මාගේ හා තාත්තාගේ ගුණ කියැවෙන සාහිත්‍ය නිර්මාණ රස විඳින විට තම සිත්හි උපදින ආදරණීය හැඟීම නිසා ම පුද්ගලයා තුළ දෙමවුපියන් ගැන ගෞරවය හා ආදරය ඇති වෙයි.

මවුපියනට ආදරය කරන දරුවන් සමාජයට අවැඩක් කරන්නේ නැත. සාහිත්‍යය ඒ සඳහා ඔවුන්ට උපදෙස් දෙයි.

පුල හෙළ කුසුම **ලිය පිය** තෙපල රන් කෙඬි...
බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩි

**සැළලිහිණි සංදේශය**

පෙර මග සුබ නිමිති ගැන පවසන රාහුල හිමි, ප්‍රිය වචන කතා කරන්නිය සුබ නිමිත්තක් බව කියයි. ප්‍රිය වචන කතා කරන්නට මුළු සමාජය ම උත්සාහ ගන්නේ නම් වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වැනි මිනිසා විනාශ කරන හැඟීම් පහළ නොවනු ඇති. නන්දිවිසාල ජාතකය ප්‍රිය වචන කතා කිරීමේ වැදගත්කම ගැන අපට මහඟු ආදර්ශයක් සපයයි. එහි කියවෙන බ්‍රාහ්මණයා තරගයෙන් පරාජය වීම සිදු වන්නේ බර උසුලන වෘෂභයා පෙර පරිදි ගැල් ඇදීම නොකළ බැවිනි. එය එසේ වූයේ "අදුව කූළ, උසුලව කූළ" යනුවෙන් සැරපරුෂ ලෙස අණ දීම නිසා ය. පරාජයට පත් වී ශෝකයෙන් පසු වුණු බ්‍රාහ්මණයාට වෘෂභයා පවසන්නේ මෙසේ ය.

> "බ්‍රාහ්මණය, මෙපමණ කලක් තොපගේ ගෙයි වසන්නා වූ මා විසින් කිසි භාජනයක් බිඳපීමක් හෝ කිසිවක් මැඩ මිරිකීමක් හෝ නුසුදුසු තැනෙක්හි මලමූත්‍ර බැහීමක් හෝ කළ විරි දැ ද? එසේ කල්හි මට කවර දෝෂයකින් කුළුවාදයෙන් කීයෙහි ද?"

සැර පරුෂ වචනයෙන් කතා කිරීම නිසා සිදු වූ පාඩුව ගැන හා එය කොතරම් අයහපත සාදන්නේ ද යන්න පැහැදිලි කළ බුදුන් වහන්සේ "අන්‍යයන් හා කථා කරන්නේ චතුර්දෝෂ

විරහිත වූ මිහිරි වූ මටසිලුටු වූ මොළොක් වූ ප්‍රිය වචනයෙන් ම බිණිය යුත්තේ ය. කිසි කලෙක්හිත් අමනෝඥ වචනය නො බිණිය යුත්තේ ය,'' යනුවෙන් ශික්ෂාපද පැනවූ සේක. සාහිත්‍ය නිර්මාණ මගින්, යහපත් වචනය පුද්ගලයාගේ යහපත සලසන සාරධර්මයක් බව පැහැදිලි කෙරෙයි. සමාජයේ ජීවත් වන විට අන්‍යෝන්‍ය සබැඳියාව සඳහා ද ප්‍රිය වචන බලපාන බව ඇස්. මහින්ද හිමියන්ගේ පහත පද්‍යයෙන් ද ප්‍රකට වෙයි.

කඩු දහයෙකින් වන රිදුමට වඩා රළු
එක තෙපලකින් වන රිදුමට වෙයි කැකුළු
මනු ලොව දුකින් ගලවනු රිසි නම් යහළු
පිය වදනකින් සනහනු සත් වග සියලු

මේ සමාජයේ බොහෝ ව්‍යසන හා අපරාධවලට හේතු වන්නේ වචන භාවිත කිරීමේ දී ඒ පිළිබඳව දෙවරක් නොසිතීම යි. මේ දුර්ගුණය මග හරවා ගෙන යහගුණය වඩවා ගෙන අන්‍යයන්ට සතුට, සහනය ලබා දීමට සාහිත්‍ය නිර්මාණ මගින් ලැබෙන පිටිවහල කොතෙක් දැයි වැටහෙනු ඇත.

දෙයක් වේ නම් යම්
සුදුස්සාට ම අයිති විය යුතු
ම කියනා ලෙස මෙලෙද
ලැබිය යුතු අයමයි ලැබිය යුතු

- **බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ**
The Cocacian chalk circle
නාට්‍යයේ සිංහලානුවාදයෙනි.

සමාජයේ බොහෝ ගැටලු මතු වන්නේ සුදුස්සාට සුදුසු තැන නො ලැබෙන නිසා ය. මෙයින් පුද්ගලයා ද සමාජය ද පිරිහෙයි. විනාශකාරී තත්ත්වයන් මතු වෙයි. හෙන්රි ජයසේනයන් නිෂ්පාදනය කළ හුණුවටයේ කතාව නම් වේදිකා නාට්‍යය අපට මේ බව පසක් කරයි.

මෙය සමාජයේ වෙසෙන සියලු දෙනා ම පිළිගත යුතු, පිළිපැදිය යුතු දහමකි. එමගින් බොහෝ ගැටලු විසඳා ගත හැකි ය. වර්තමානයේ බොහෝ ආයතන පරිහානිය කරා යන්නේ නුසුදුස්සන්ට තනතුරු ලබා දීමෙනි. අපේ ම සාහිත්‍යය අපට උපදෙස් දෙන්නේ එබඳු අමනෝඥ ක්‍රියා නො කරන ලෙස යි. සුදුස්සා සුදුසු ලෙස කටයුතු කරද්දී සියල්ල යහපත් වනු ඇත.

සොබා දහම අපට බොහෝ දේ ලබා දෙයි. ඒත් අප සොබා දහමට ලබා දෙන්නේ මොනවා ද? සුළඟ, වැස්ස, අව්ව, තුරුලතා, සෙවණ, වැලිතලා, කුරුලු ගීත, බිඳෙන රළෙහි සිසිලස, ගංගා දියඇලිවල සුන්දරත්වය යනාදි සියල්ල අපට ලබා දෙන මේ ලෝකයට අප ලබා දෙන්නේ මොනවා ද?

ඉස්සර කාලේ ඉර හඳ සෙවණේ
ගහ කොළ නැමඳූ මිනිසුන්නේ
ඔබ දැන සිටියා වනන්තරේ වග
ඒකයි කළ ගුණ මෙනෙහි කළේ ...

- විනීතා අබේවික්‍රම

අතීතයේ ගොවියා කුඹුරු ලියැද්දක් ඉතිරි කළේ ද කුරුල්ලන්ට ය. එය 'කුරුලු පාළුව' නමින් හැඳින්විණි. අද එය ද සමාජයෙන් ක්‍රමයෙන් ඉවත් වන ලකුණු පෙනේ. පොඩි මල්ලියේ නම් පද්‍ය නිර්මාණය, මේ සාරධර්ම සමාජය තුළ පෝෂණය කරවන්නට ගත් උත්සාහයක් ලෙස ද හැඳින්විය හැකි යි.

මේ සේරම තෑගි ලැබුණෙ ලොවින් - නුඹට
මොනවද මල්ලියෙ දෙන්නේ නුඹෙන් ලොවට
එක පාරට
ටකේ ගසන්නෙපා මලේ
කුරුල්ලංට
ඉඩක් දියං
එක කරලක් ඇදං යන්ට

- පරාක්‍රම කොඩිතුවක්කු

ආගන්තුකයකුට කරන සත්කාරය ද සමාජයේ වැදගත් සාරධර්මයකි.

පෙර දැක නොමැති මුත් සුන්දරහාමි විසින්
මගෙ තොරතුරු ඇසූ සැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වී ය මට සොම්නස පිරුණු ඇසින්

- විමලරත්න කුමාරගම

සිංහල සාහිත්‍යයේ පමණක් නොව **භගවද් ගීතාව, උපදේශ ශතකය, නීති ශතකය, හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය ප්‍රත්‍යය ශතකය** වැනි සංස්කෘත ග්‍රන්ථ මගින් ද සාරධර්ම වර්ධනය කර ගැනීම සඳහා සපයන උපදේශ බොහෝ ය. නූතන සමාජයෙහි පවතින අපරාධ, අසාධාරණ හා ව්‍යසන සඳහා ප්‍රධාන වශයෙන් බලපාන්නේ සාරධර්ම පිරිහීම යි. ඊට පිළියමක් ලෙස පොත පත ඇසුරෙන් සාරධර්ම වටහා ගෙන, ඒවා අප තුළ වර්ධනය කර ගෙන අන්‍යයන් තුළත් සාරධර්ම ඇති කිරීමට ඇප කැප වෙමු.

පිදුරුතලාගල සේ උස් ප්‍රාර්ථනා
සමනොළ ගල එකමුතුකම
මිහින්තලාවේ නැණ ගුණ
සීගිරියේ යසිසුරු
මහපොළොව සේ පැරණි දිවයිනක
මහවැලිය සේ පැරණි ලේ නහර
ධර්මේ,
කාසිම්,
රාජසුන්දරම්
වරෙල්ල
අපි ඔක්කොම එකතු වෙලා
මේ ලෝකය
යහපත් තැනක් කරමු මීට වැඩිය ...

- **මහගම සේකර**

## අවබෝධය

1. **සාරධර්ම යනු මොනවා දැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න.**
2. **සිංහල සාහිත්‍යයෙහි එන උපදේශ කාව්‍ය තුනක් නම් කරන්න.**
3. **මේ පාඩමේ විස්තර කෙරෙන සාරධර්ම පහක් කෙටියෙන් හඳුන්වන්න.**
4. **විවිධ ආගම් අදහන්නන් තුළ සාරධර්ම වර්ධනය කිරීම සඳහා භාවිත කරන ධර්ම ග්‍රන්ථ තුනක් නම් කරන්න.**
5. **වර්තමාන සමාජය තුළ සාරධර්ම ඇති කිරීම සඳහා නිර්මාණ බිහි කළ ලේඛකයන් තිදෙනකු නම් කරන්න.**

## ලිඛිත අභ්‍යාස

1. **පන්තියේ සිසුන් කණ්ඩායම් පහකට බෙදී, පහත සඳහන් පැවරුම්වල නිරත වන්න.**

I කණ්ඩායම

සාරධර්ම පිළිබඳව කියැවෙන කවි දහයක් **සිරිත්මල්දම** ග්‍රන්ථයෙන් උපුටා දක්වන්න.

II කණ්ඩායම

**සුභාෂිතයෙන්** තෝරා ගත් කවි දහයක ඇතුළත් උපදේශ විස්තර කරන්න.

III කණ්ඩායම

**ලෝකෝපකාරය** නම් ග්‍රන්ථයේ දැක්වෙන උපදේශ දහයක් සඳහා උදාහරණ දක්වන්න.

iv කණ්ඩායම

කණ්ඩායමට ඇතුළත් සෑම කෙනකුම **ලෝවැඩ සඟරාවෙහි** ඇතුළත් පද්‍යයක් බැගින් තෝරා ගෙන එයින් කියැවෙන උපදේශ මගින් සාරධර්ම පෝෂණය වන ආකාරය පැහැදිලි කරන්න.

v කණ්ඩායම

උපදේශයක් ඇතුළත් ගීත ඉදිරිපත් කර, එමගින් සාරධර්ම වර්ධනය කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.



# නිපාත පද

අප උගත් නාම පද හා ක්‍රියා පද විවිධ ආකාරයෙන් වර නැඟිය හැකි ය. වචන භේදයෙහි හා ලිංග භේදයෙහි නාම පද වර නැඟේ. ක්‍රියා පද පුරුෂ භේදයෙහි හා කාල භේදයෙහි වර නැඟේ. එහෙත් එලෙස වෙනස් කළ නොහැකි පද විශේෂයක් සිංහලයෙහි ඇත. ඒවා 'අව්‍යය පද' ලෙස හැඳින්වෙයි. අව්‍යය පද නිපාත හා උපසර්ග ලෙස වර්ග දෙකකි. පදයක මුලින් යෙදී එම පදයේ අර්ථයට විරුද්ධාර්ථයක් දෙන, අර්ථය තීව්‍ර කරන පද විශේෂය උපසර්ග නම් වේ. නිපාත පදවලින් කෙරෙන්නේ වාක්‍යයක අර්ථය පැහැදිලි වන සේ එහි පද සම්බන්ධ කිරීමේ කාර්යය යි. පහත සඳහන් වැකිය කියවන්න.

**අම්මා දරුවා ගමට යයි.**

මෙහි අර්ථය පැහැදිලි නැත. අර්ථය පැහැදිලි කිරීම සඳහා මේ වාක්‍යය වෙනස් කරන්නට නිපාත පද යෙදිය යුතු යි.

| |
|---|
| අම්මා **සමග** දරුවා ගමට යයි. |
| අම්මා **ද** දරුවා **ද** ගමට යති. |
| අම්මා**ත්** දරුවා**ත්** ගමට යති. |
| අම්මා **නොහොත්** දරුවා ගමට යයි. |
| අම්මා එන **තුරු** දරුවා ගමට යයි. |
| අම්මා **වෙනුවෙන්** දරුවා ගමට යයි. |
| අම්මා **නිසා** දරුවා ගමට යයි. |

මේ ආදි වශයෙන් නිපාත පද යොදා, පද සම්බන්ධ කර අර්ථය පැහැදිලි වාක්‍යයක් නිර්මාණය කළ හැකි ය. නිපාත පද වෙන් කොට ලිවිය යුතු වුවත් විටෙක සමහර නිපාත පද අනෙක් පදයක් සමඟ එක්ව ද භාවිත වේ. නිපාත පද විවිධ අර්ථවල යෙදෙයි.

පහත සඳහන් වගුව හොඳින් අවබෝධ කර ගනිමු.

| අර්ථය | අදාළ නිපාත |
|---|---|
| කාලාර්ථය<br>(කාලය හැඟවීම) | අද, හෙට, ඊයේ, යළි නිරතුරු, ඉක්බිති, නිතොර, දැන්, නිති, පුන, පැසුළු |
| සමුච්චයාර්ථය<br>(පද සම්බන්ධ කිරීම) | ද, ත්, සහ, හා, සමග, කැටුව, යි |
| භාවාර්ථය<br>(හැඟීම් දැනවීම) | අනේ, අපොයි, අය්යෝ, අහා, ඔහෝ, ආයි, ඌයි, චිඃ, ඌඃ |
| ආමන්ත්‍රණාර්ථය<br>(ඇමතීම) | එම්බා, එම්බල, කොල, ඒයි, බොල |
| ප්‍රමාණාර්ථය<br>(ප්‍රමාණය දැක්වීම) | විතර, තරම්, සා, තාක්, තුවක්, බැගින් |
| විකල්පාර්ථය<br>(යමක් වෙනුවට යන අදහස දීම) | හෝ, නොහොත්, හෙවත් |
| පිණිස අර්ථය<br>(යමක් වෙනුවෙන් යන අර්ථය) | උදෙසා, සඳහා, පිණිස, නිසා, වස්, අරබයා, වෙනුවෙන් |
| සීමාර්ථය<br>(සීමාව දැක්වීම) | සිට, පටන්, තෙක්, දක්වා, තුරු |
| ශීඝ්‍රාර්ථය | සෙද, වහා, සැණින්, හනික |
| විනාර්ථය | විනා, හැර, මිස, මිසක්, මුත් |
| විභක්ත්‍යාර්ථය | විසින්, ගෙන්, කෙරෙන්, හට, කෙරෙහි, තුළ, මත, උඩ |
| උපමාර්ථය | මෙන්, සේ, වැනි, වගේ, අයුරු, ලෙස, බඳු, එව් |
| හේතු අර්ථය | නිසා, බැවින්, හෙයින්, අරබයා |
| ප්‍රශ්නාර්ථය | ඇයි, කිම, ද, මන්ද, |

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් නිපාත පද කවර අර්ථයක් ප්‍රකාශ කරන්නේ දැ'යි ඉදිරියෙන් ලියා දක්වන්න.**

| | | | |
|---|---|---|---|
| සඳහා | - | අද | - |
| පුන පුනා | - | අයියෝ | - |
| සහ | - | මෙන් | - |
| නොහොත් | - | දක්වා | - |
| විසින් | - | නිසා | - |

2. **පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා සුදුසු නිපාත යොදන්න.**

i. දෙවියන් ............................ පුද පූජා පැවැත්වීම විපතට පත් වූ බොහෝ දෙනාගේ කාර්යයකි.

ii. ශීඝ්‍රගාමී දුම්රිය මරදාන දුම්රිය ස්ථානයේ ............................ අනුරාධපුර ............................ ගමන් කරයි.

iii. රූපශ්‍රීය ............................ ඈ දෙවඟනක ............................ බබළයි.

iv. පරිසර දිනය සැමරීම ............................ විදුහල්පතිතුමා ............................ සිසුහු ........................ කටයුතු සූදානම් කරති.

v. ............................ දුෂ්ටය, තා මේ මග රැක සිටිමින් තැත් කරන්නේ මා ............................ මාගේ සේනාව ආක්‍රමණය කරන්නට ද?

3. **පහත සඳහන් පද්‍ය පාඨවල යෙදී ඇති නිපාත උපුටා දක්වන්න.**

i. "ළමයෙක් ඒ අසා - හැඬී බළලකු විලසා"

ii. "කිම් ද මැණියනි ඔබ මේ - පවසන වදනා"

iii. "ළිප ගිනි මොළොවන තෙක් දිය සැළියේ
සැපයක් යැයි කකුළුව දිය කෙළියේ"

iv. "නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රැති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ"

v. "සුරන් සහ සහසැස් - නොකර සිටියේ අහස් කුස් හිස්"

1. විවිධාර්ථවත් නිපාත පද විවිධ හැඩතල සහිත පත්‍රිකාවල ලියා, පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
2. නිපාත පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.
3. පෙළපොතෙහි ඔබ කැමැති පාඩමක යෙදී ඇති නිපාත පද තෝරා ලියන්න.
4. පහත සඳහන් නිපාත විවිධ හැඟීම් ඇති වන ආකාරයට උච්චාරණය කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | අනේ | - | ii. | අයියෝ | - |
| iii. | එපා | - | iv. | ඇයි | - |
| v. | ඉතින් | - | | | |



# නිවැරදිව වචන වෙන් කරමු

අදහස් ප්‍රකාශ කිරීමේ දී එය ශ්‍රාවකයාට අවබෝධ කරවීමේ උපාය මාර්ග ලෙස, අවශ්‍ය තැන්වල දී හඬ උස් පහත් කිරීම හා ඒ ඒ අදාළ වචනවලට පසුව විරාමයක් තැබීම භාවිත කෙරෙයි. එහෙත් ලේඛනයේ දී පාඨයක අදහස පැහැදිලි කිරීම සඳහා උපක්‍රම දෙකක් භාවිත කෙරේ. ඒ විරාම ලක්ෂණ යෙදීම හා නිවැරදිව වචන වෙන් කිරීම යි. සිංහලයේ ප්‍රධාන වශයෙන් පද වර්ග තුනකි. නාම පද, ක්‍රියා පද හා අව්‍යය පද යනුවෙන් එම පද වර්ග හැඳින්වේ. නාම පද හා ක්‍රියා පද වෙන් කොට ලියා දක්වන අතර අව්‍යය පද ගණයට අයත් උපසර්ග වෙන් කොට ලියා දක්වන්නේ නැත. නිපාත පද වෙන් කොට ලිවිය යුතු වුවත් සමහර නිපාත වෙන් කොට ලියන්නේ නැත.

පද බෙදා ලිවීම හා සම්බන්ධ රීති හා සම්මත රාශියක් වෙයි. ඒ අතුරින් රීති හා සම්මත කීපයක් අපි උගනිමු.

### සම්බන්ධවාචී 'ත්' නිපාතය පෙර පදය හා එක් කොට ලිවීම

උදාහරණ:- ඔහුත් මමත් තරගයට සහභාගි වෙමු.
අම්මාත් අයියාත් පාසලට යැමට පිටත් වූහ.

### විධි ක්‍රියා පදවල යෙදෙන 'ව' 'වු' ප්‍රත්‍යය එක් කොට ලිවීම

උදාහරණ :- කරව, කරවු, බලව, බලවු.
ඔබට පැවරූ කාර්යය හොඳින් ඉටු කරවු.
සෙබළුනි, යුද්ධය සඳහා පිටත් වී යැමට සැරසෙවු.
නිරතුරුව කුසල් රැස් කරවු.
ඔවුන් පලා ගියේ දැ'යි විමසවු.

### ප්‍රාර්ථනාර්ථ 'වා' ප්‍රත්‍යය එක් කොට ලිවීම

උදාහරණ:- මම නිදුක් වෙම්වා!
නුඹලාට ශිල්ප සැදේවා!
දරුවෝ යහමග යත්වා!
නුඹ නීතිගරුක වෙහිවා!

### ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථයේ 'ව, වී, වූ, වන' ප්‍රත්‍යය එක් කොට ලිවීම

උදාහරණ:- තාත්තා පෙදරේරුවන් ලවා ගොඩනැගිල්ල තනවයි.
සංවිධායකයා, නිවේදකයා ලවා උත්සවය ආරම්භ කරවී ය.
රජවරුන් කරවූ වැව් අපට සම්පතකි.
අලසයන් ලවා කරවන කුඹුරුවලින් නියමිත අස්වැන්න නො ලැබේ.

ඉහතින් දැක්වූයේ පද බෙදීම සම්බන්ධයෙන් සම්මත වූ රීති කීපයකි. ලේඛනයේ දී මේ රීති හඳුනා ගෙන ඒවා අනුගමනය කරමින් නිවැරදි ලේඛන ව්‍යවහාරයක යෙදෙන්න.

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් පාඨ නිවැරදිව පද බෙදා ලියන්න.**

    i. නවය ශ්‍රේණියේ පන්තිභාර ගුරුතුමිය සිසුන් ලවා සූදානම් කර වූ චාරිකාවට ගුරුවරු ත් විදුහල්පතිතුමා ත් සතුටින් සහභාගි වූහ.

    ii. සංවිධායක මණ්ඩලය විසින් කැඳ වන ලද දේශකයා සියලු දෙනාට ම සුබ දවසක් වේ වා! යි පතමින් දේශනය ආරම්භ කළේ ය.

    iii. තෙලු ත් මලු ත් රැගෙන පන්සලට යන සැදැහැවතුන් දේවාලයට ද ගොස් වෙනත් අය ලවා යාතිකා කර වන අයුරු අපි බලා සිටියෙමු.

    iv. බල ව අනුරාපුර හා පොලොන්නරු වැව් සයුරුවල අපූරුව!

    v. නැර ලොලය වඩ වන දුටු දනන් හට<br>කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

2. **පහත සඳහන් පාඨවල වචන නිවැරදිව වෙන් කර නැවත ලියන්න.**

    i. පාසලනිමවීනිවෙසටයනවිට වැස්සක්ඇදහැළුණුනිසා මල්ලීත්මමත් අඩක්නිමකරවූනිවෙසකට ගොඩවැදුණෙමු.

    ii. රාජපුරුෂයිනිවහා කුමරුන්කැඳවවු.

    iii. ඔබටයහපතක්මවේවා!

    iv. කරවපියාසරසකිකොන්තගංතොටින්

    v. මිනිසුන්ලවාපොල්කඩවනඅම්මා දෙසමල්ලීත්අයියාත්බලාසිටිති.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පෙළපොතෙහි පාඩම් හොඳින් කියවා, ඒවායෙහි වචන වෙන් කර ඇති ආකාරය හඳුනා ගන්න.**

2. **නිවැරදිව වචන වෙන් නොකිරීම නිසා අදහස වෙනස් වන අවස්ථාවලට උදාහරණ සපයන්න.**

    උදාහරණ - ඔහු බලියා ගත් පහ තරට බෙර වාද නයත් උගත් තේ ය.